جنات کا بادشاہ

# ජින්වරුන්ගේ රජු

ගව්සු අ:ලම් رضی اللہ تعالیٰ عنہ තුමාණන්ගේ තවත් කරාමතයන් සමඟ

# KING OF JINNS

(With some Marvels of Ghaus-e-A'zam رضی اللہ تعالیٰ عنہ)

අමීරේ අහ්ලුස්සුන්නත්, අබු බිලාල් හස්රත් අල්ලාමා මෞලානා
මුහම්මද් ඉල්යාස් අත්තාර් (කාදිරි, රzසවි)
(دامت برکاتہم العالیہ)
තුමාණන් විසින් උර්දු භාෂාවෙන් කළ දේශනයේ සිංහල පරිවර්තනය

**ෆයිසානේ මදීනා**

නො. 10, මැසන්ජර් වීදිය, කොළඹ - 12
දුරකථනය : (011) 2394748/9
Email : maktaba@dawateislami.net
Website : www.dawateislami.net

اَلْحَمْدُ لِلّٰهِ رَبِّ الْعٰلَمِيْنَ وَالصَّلٰوةُ وَالسَّلَامُ عَلٰى سَيِّدِ الْمُرْسَلِيْنَ
اَمَّا بَعْدُ فَاَعُوْذُ بِاللّٰهِ مِنَ الشَّيْطٰنِ الرَّجِيْمِ ؕ بِسْمِ اللّٰهِ الرَّحْمٰنِ الرَّحِيْمِ ؕ

# පොත කියවීමේ දූආ

ෂෙයික් ඒ තරීකත් අමීරේ අහ්ලුස්සුන්නත්, දඃවතේ ඉස්ලාමියේ නිර්මාතෘ, හස්රත් අල්ලාමා මෞලානා අබූ බිලාල් මුහම්මද් ඉල්සාස් අත්තාර් කාදිරී, රzසවී دَامَتْ بَرَكَاتُهُمُ الْعَالِيَة

ආගමික හෝ වෙනත් ඉස්ලාම් පොත්පත් කියවීමට පෙර පහත සඳහන් දූආ කියවන්න ඉන්ෂා අල්ලාහ් عَزَّوَجَلَّ කියවන දේ මතක තබාගත හැකිවේ. එම දූආව

اَللّٰهُمَّ افْتَحْ عَلَيْنَا حِكْمَتَكَ وَانْشُرْ عَلَيْنَا رَحْمَتَكَ يَا ذَا الْجَلَالِ وَالْاِكْرَام

**තේරුම** :- යා අල්ලාහ් عَزَّوَجَلَّ අපහට ඉල්ම් හා හික්මතයේ දොරටුව විවෘත කරනු මැන. තවද අපහට ඔබේ කරුණාව පහළකරනු මැන. උසස් හා ශ්‍රේෂ්ඨයාණෙනී, (අල්මුස්තත්රප්, ජී1. පි.40 කෝ1. දරුල්පික්ර්බේරුත්) සඳහන් :- පෙර පසු එක්වරක් සලවාතය පාරායණ කරන්න.

# ජින්වරුන්ගේ රජු


අමීරේ අහ්ලුස්සුන්නත්, අබු බිලාල් හස්රත් අල්ලාමා මෞලානා
මුහම්මද් ඉල්යාස් අත්තාර් (කාදිරි, රZසවි)
(دامت بركاتهم العاليه)
තුමාණන් විසින් උර්දු භාෂාවෙන් කළ දේශනයේ සිංහල පරිවර්තනය



**ෆයිසානේ මදීනා**

නො. 10, මැසන්ජර් වීදිය, කොළඹ - 12
දුරකථනය : (011) 2394748/9
**Email : maktaba@dawateislami.net**
**Website : www.dawateislami.net**

# පටුන


1. ජින්වරුන්ගේ නායකයා ........................................................3
2. සලවාතයේ මහිමය ...............................................................3
3. කබ්රයේ වේදනාවෙන් නිදහස් ...............................................5
4. මෘතදේහයේ විලාපය ............................................................6
5. ගව්සුල් ආලම් තුමාණන්ගේ ස්නේහවන්තයා (වශී වූ තැනැත්තා)..................................................................7
6. සිත අත්ල තුලයි තිබෙන්නේ ..................................................9
7. අල්මදද් යා ගවුසුල් අඃලම් .....................................................9
8. ගව්සියා සාලාතය ඉටුකරන ක්‍රම ........................................ 10
9. අල්ලාහ් عَزَّوَجَلَّ හැර වෙන කෙනෙකුගෙන් උදව් පැතීම .............11
10. හස්රත් ඊසා අනුන්ගෙන් උදව් පැතීම ................................... 12
11. හස්රත් මූසා මිනිසාගේ පිහිට පැතීම ................................... 12
12. ගුණ යහපත් පුරවැසියන් ද උපකාර කරන්නන්ය .................... 13
13. අන්සාර් වල තේරුම පිහිටවන්නාය........................................ 13
14. අහ්ලුල්ලාහ් ජීවත් වෙති (අල්ලාහ්ගේ සමීපතයන්) .................. 14
15. නබිවරුන් ජීවත්වෙති ............................................................ 15
16. අව්ලියාවරුන් ජීවතුන් අතර සිටිති ......................................... 15
17. ඉමාමේ අඃලම් علیہ رحمۃ اللہ الاکرم තුමාණන් සර්කාර් صلی اللہ تعالیٰ علیہ والہ وسلم තුමාණන්ගෙන් පිහිට පැතීය...................... 15
18. බූසරී ඉමාම් ද උදව් (පිහිට) පැතීම ........................................ 16
19. ෂාහ් වලියුල්ලාහ් ගේ ඉඃතිකාද් (විශ්වාසය) ............................ 17
20. ලෝටා පෝච්චිය (කේතලයට සමාන භාජනයක්) ....................... 17
21. ලෝටා පෝච්චිය කිබ්ලාව දෙසට තබන්න .................................18
22. කිබ්ලාව දෙසට හැරී වාඩිවන්නාගේ සිද්ධිය ............................ 18
23. "කඃබතුල්ලාහිල් කරීම්" යන වාක්‍යයේ ඇති අක්ෂර 14 ට කිබ්ලාව දෙසට හැරී සිටීම සරිලන සේ මදනි පුෂ්පයන් 14 ක් ...................20

اَلْحَمْدُ لِلّٰهِ رَبِّ الْعٰلَمِيْنَ وَالصَّلٰوةُ وَالسَّلَامُ عَلٰى سَيِّدِ الْمُرْسَلِيْنَ
اَمَّا بَعْدُ فَاَعُوْذُ بِاللّٰهِ مِنَ الشَّيْطٰنِ الرَّجِيْمِ ؕ بِسْمِ اللّٰهِ الرَّحْمٰنِ الرَّحِيْمِ ؕ

# ජින්වරුන්ගේ නායකයා

ෂෛතාන් ඔබට මෙම පොත කියවීමෙන් වැළැක්වීමට කොතරම් උත්සාහ කලත් ඔබ මෙය ආරම්භයේ සිට අවසානය දක්වා කියවන්න. ඉන්ෂා අල්ලාහ් عَزَّوَجَلَّ ඔබේ ඊමානයේ (විශ්වාසයේ) පිබිදීමක් ඇතිවෙයි.

# සලවාතයේ මහිමය

නබිවරුන්ගේ නායක, රහ්මතුල් ලිල් ආලමීන්, දෙලොවටම අධිපති, මහ්බූබේ රහ්මාන් صَلَّى اللّٰهُ تَعَالٰى عَلَيْهِ وَاٰلِهٖ وَسَلَّم තුමාණන්ගේ රුවන් වැකියක් නම් “යම් කෙනෙක් සිකුරාදා දිනයේ මාගේ නාමයෙන් 200 වරක් සලවාතය පරායණාකරයි නම් ඔහුගේ අවුරුදු 200ක පාපයන් සමා කරනු ලබන්නේය. (කන්සුල් උම්මාල් කො 1 පි 256 හදීස් 2238)

صَلُّوْا عَلَى الْحَبِيْب! صَلَّى اللّٰهُ تَعَالٰى عَلٰى مُحَمَّد

අබූ සඃද් අබ්දුල්ලාහ් බින් අහ්මද් මෙසේ පවසා සිටින්නේය. වරක් මාගේ දියණිය වන ෆාතිමා උඩු මහලේ සිට එක් වරම අතුරුදහන් වූවාය. මා කිසිවක් කර ගත නොහැකිව සර්කාරේ බග්දාද් සෛයිදුනා ගවුසේ පාක් (ගවුසුල් අඃලම්) رَحْمَةُ اللّٰهِ تَعَالٰى عَلَيْه තුමාණන් වෙත පැමිණ පැමිණිලි කර සිටියෙමි. එවිට එතුමාණන් මෙසේ පැවසූහ.

ඔබ කර්හක් නැමැති ස්ථානයට ගොස් පාළු තැනක පස් කන්දක තම වටේට වැටක් ගසා වාඩි වෙන්න. එහිදී මාව සිතින් මවා ගන්න. තවද බිස්මිල්ලාහ් කියා ගන්න රාත්‍රි ඝණ අඳුරේ ජින්වරුන් ඔබ අසලින් ගමන් කළ හැක. ඔවුන්ගේ ස්වරූපයන් දැක බය නොවන්න. සහර් වේලාවේදී ජින්වරුන්ගේ නායකයා ඔබ අසලට පැමිණ ඔහු ඔබේ අවශ්‍යතාවය කුමක්දැයි අසනු ඇත. එවිට ඔහුට කියන්න මාව ෂෙයික් අබ්දුල් කාදිර් ජීලානි قُدِّسَ سِرُّهُ الرَّبَّانِي තුමාණන් බග්දාද් වල සිට මාගේ දියණිය සොයා දෙනු මැන.

ඉන්පසු මා කර්හක් නැමැති ගම්මානයේ පාළු තැනක හස්රත් ගවුසුල් අ:ලාම් قُدِّسَ سِرُّهُ الرَّبَّانِي තුමාණන් පැවසූ ආකාරයටම කටයුතු කළෙමි. රාත්‍රි කාලයේ භයංකාර පෙනුමැති ජින්වරුන් මා අසලින් ගමන් කරමින් සිටින ආකාරය ත්‍රාසයෙන් යුතුව බලා සිටියෙමි. සහර් වේලාවේදී ජින්වරුන්ගේ නායක අශ්වයකු පිට නැගී ජින්වරුන් වට කර ගෙන පැමිණ මාගේ මායිම් වැටෙන් පිට සිට මාගේ අවශ්‍යතාවය කුමක්දැයි විමසා සිටියේය. එවිට මා හස්රත් ගවුසුල් අ:ලම් قُدِّسَ سِرُّهُ الرَّبَّانِي තුමාණන් විසින් ඔබ වෙතට එවූ බව පවසත්ම තම අශ්වයාගේ පිටෙන් බැස බිම ඉඳ ගත්තේය. ඒ සමඟ පැමිණි අනෙකුත් ජින්වරුන් සියලු දෙනාම මායිමෙන් පිට ඉඳ ගත්හ. මා මාගේ දියණිය නැති වූ ආකාරය විස්තර කළ පසු ඔහු සියලු ජින්වරුන්ට ඒ පිළිබඳව දැනුම් දී දියණිය රැගෙන ගියේ කවුරුන්දැයි විමසා සිටියේය. ස්වල්ප වේලාවකින් චීන ජින් කෙනෙකු වරද කරු ලෙස ඉදිරිපත් කරන ලදී. ජින්වරුන්ගේ

නායකයා එම ජින්වරයාගෙන් කුත්බුZස් Zසමාන් හස්රත් ගවුසුල් අ:ලම් رحمۃ اللہ تعالیٰ علیہ තුමණාන්ගේ නගරයෙන් දැරිය රැගෙන ගියේ ඇයි දැයි විමසා සිටියේය. ඔහු වෙව්ලමින් උතුමාණෙනි, මා දුටු විගස ඇයට වශී වුණෙමියි පිළිතුරු දුන්නේ ය. නායකයා ද එවෙලේම එම ජින්වරායාගේ හිස ගසා දැමීමට අණ කළ අතර මාගේ දියණිය මට ලබා දුන්නේය.

මා ජින්වරුන්ගේ නායකයාට ස්තූති කරන අතර මාෂා අල්ලාහ් عَزَّوَجَلَّ ඔබත් සෙයදුනා ගවුසුල් අ:ලම් قُدِّسَ سِرُّہُ الرَّبَّانِی තුමාණන්ව ඉතාමත් ප්‍රිය කරන්නෙක් යැයි පැවසූ විට ඔහු දෙවියන්ගේ නාමයෙන් දිවුරමි. හස්රත් ගවුසුල් අ:ලාම් قُدِّسَ سِرُّہُ الرَّبَّانِی තුමාණන් අප දෙස බැල්ම හෙලන විට අප සියලු ජින්වරුන් වෙව්ලා යන්නෙමු. අල්ලාහ් තආලා කිසිවෙකු කුත්බුස්Zසමාන් බවට පත් කරන අවස්ථාවේ සියලු ජින්වරුන් හා මිනිසුන් ඔවුන්ට අවනත කර දෙන්නේය යනුවෙන් පැවසුවේය.

صَلُّوْا عَلَى الْحَبِيْب!　　صَلَّى اللّٰهُ تَعَالٰى عَلٰى مُحَمَّد

## කබ්රයේ වේදනාවෙන් නිදහස්

එක් දුක්මුසු තරුණයෙක් ගවුසුල් ආලම් قُدِّسَ سِرُّہُ الرَّبَّانِی තුමාණන්ගේ මජ්ලිසයට පැමිණ යාසෙය්යිදී මා මාගේ පියාණන්ව රාත්‍රියේ සිහිනෙන් දුටුවෙමි. ඔහු මාහට පුතා! මා කබ්රයේ වේදනාවෙන් පෙළෙමි. ඔබ සෙයිදුනා ෂෙයික් අබ්දුල් කාදීර් ජීලානි قُدِّسَ سِرُّہُ الرَّبَّانِی තුමාණන් වෙත ගොස් මා වෙනුවෙන් ප්‍රාර්ථනා

කරන්නැයි ඉල්ලා සිටියේය. මෙය අසා සර්කාරේ බග්දාද් හස්රත් ගව්සුල් අ:ලම් عليه رحمة الله الاكرم තුමාණන් ඔහුගෙන් මෙසේ විමසා සිටියහ. ඔබේ පියාණන් කවදාක හෝ මාගේ මදර්සාව අසලින් ගමන් කර තිබේද? එම තරුණයා ඔව් යනුවෙන් පිළිතුරු දුන් පසු එතුමාණන් නිශ්ශබ්ද වූහ. එම තරුණයා ද නික්ම ගියේය. දෙවැනි දිනයේ එම තරුණයා ඉතාමත් සතුටින් පැමිණ මෙසේ පැවසූහ. “යාමුර්ෂිද්” අද රාත්‍රියේ මා පියාණන්ව සිහිනෙන් දුටුවෙමි. එතුමා කොළ පාට ඇඳුමෙන් සැරසී ඉතාමත් සතුටින් සිටි අතර මා හට පුතා! සෛයිදුනා ෂෛයික් අබ්දුල් කාදිර් ජීලානී قُدِّسَ سِرُّهُ الرَّبَّانِي තුමාණන්ගේ බරකතයෙන් මාගේ වේදනාව දුරස් කරන ලදී. තවද මෙම කොළ පාට ඇඳුමත් ලැබුණි. මාගේ ආදරණීය පුත්‍රයාණෙනි ඔබ එතුමාණන්ට (උපකාර) සේවය කිරීමට එතුමාණන් අසලම රැඳී සිටින්නැයි පවසා සිටියේය. එය අසා හස්රත් ගව්සුල් ආලම් رحمة الله تعالى عليه තුමාණන් මාගේ රබ් عَزَّوَجَلَّ මට පොරොන්දු වී සිටින්නේ යම් මුස්ලිම් කෙනෙකු ඔබේ මද්රසාව අසලින් ගමන් කළේ නම් ඔහුගේ වේදනාව අඩු කරනු ලබන බවයි.

“සකරාතයේ, කබ්රයේ, මීසානයේ, සිරාත් පාලමේ ඔබගේ දැත් නොගිලිහේවා!”

## මෘතදේහයේ විලාපය

වරක් ගවුසේ අ:ලම් عليه رحمة التَّوَّاب තුමාණන්ගේ මජ්ලිසයේ සිටින විට ජනතාව එතුමාණන්ගෙන් “බාබුල් අZසජ්” කබ්රිස්ථාන් (සොහොන් භූමියේ) එක් කබ්රයෙකින්

මෘත දේහයේ විලාප හඬක් ඇසෙන්නේය. ඔබතුමාණන් එයට කරුණා දයාව දක්වන්නේ නම් ඔහුගේ වේදනාව අඩු විය හැකියැයි ඉල්ලා සිටියෝය. එවිට එතුමාණන් ඔහු මාගේ බයිඅත් කර ඇත්දැයි විමසූහ. අපි නොදැනිමුයැයි පිළිතුරු ලැබිණි. ඔහු මාගේ මජ්ලිසයට කවදා හෝ පැමිණියා දැයි විමසූහ. ඒ බවක් නොදනිමු යැයි පිළිතුරු ලැබුණි. කවදා හෝ ඔහු මාගේ කෑම අනුභව කළේ දැයි ? විමසූහ. එවිටත් අපි නොදනිමු යැයි පිළිතුරු ලැබුණි. ඔහු මාගේ පිටුපසින් සිට සලාතය ඉටු කරාදැයි? විමසූහ. එයටත් නොදන්නා බවට පිළිතුරු ලැබුණි. එවිට එතුමාණන් තම හිස පහත් කළහ. එතුමාණන්ගෙන් ජලාල්, ගාම්භීර පෙනුමක් දක්නට ලැබුණි. ස්වල්ප වේලාවකට පසු එතුමාණන් මට දැන් මළාඉකාවරයෙකු පැමිණ ඔහු මාව දැක ඇති බව පැවසූ අතර මා ගැන පැහැදී සිටි නිසා අල්ලාහ් عَزَّوَجَلَّ තආලා ඔහුට කරුණාව දක්වා ඇතැයි පැවසූහ. අල්හම්දුලිල්ලා عَزَّوَجَلَّ එම කබ්රයේ ශබ්ද පිටවීම ද නැවතුණි.

صَلُّوْا عَلَى الْحَبِيْب! صَلَّى اللّٰهُ تَعَالٰى عَلٰى مُحَمَّد

## ගව්සුල් ආලම් තුමාණන්ගේ ස්නේහවන්තයා (වශී වූ තැනැත්තා)

මදීනාවේ ස්නේහවන්ත සේවක عُفِيَ عَنْهُ දෙමාපියන්ගේ ගම්මානය වන කුත්යානා (ගුජ්රාත්, හින්ද්) වල සිදුවීමක් කෙනෙක් මෙසේ පැවසීය. එහි ගව්සුල් අ:ලම් قُدِّسَ سِرُّهُ الرَّبَّانِی තුමාණන් ගැන පැහැදී වශී වූ කෙනෙක් සිටියේය. ඔහු ගව්සුල් අල:ම්ගේ නාමයෙන්

ඉනාමත් රබ්බියුල් ආහිර් 11වන දිනයේ ඉනාමක් ඉහලින් සැමරීය. ඔහුගේ විශේෂත්වයක් නම් සෙයියිද් (සාදාත් රසූල් صلى الله تعالى عليه واله وسلم ගේ පවුල) ඉතාමත් ගරුකරන අතර ඔවුන්ගේ කුඩා දරුවන් වඩාගෙන පැණි රස කෑම වර්ග කවන්නේ ය. ඔහු මරණයට පත් වූ පසු දේහය රෙදිවලින් වසා තිබුණි. නෑදෑ හිත මිතුරන් රැස්වී සිටියහ. එක් වරම රෙදි පැත්තකට කරමින් ඔහු නැගිට ඉඳ ගත්තේය. රැස් වී සිටි සියලු දෙනා බිය වී පැන දිවූහ. ඔහු ඔවුන්ට අඬ ගසා බය නොවන්න මා කියන දේට සවන් දෙන්නැයි පැවසූ විට ජනයා ඔහු අසලට පැමිණියහ. දැන් සිදු වුණේ මෙකයි. එනම් මාගේ නායක කුතුබුල් අක්තාබ් අෂ්ෂෙක් අබු මුහම්මද් අබ්දුල් කාදිර් ජීලානි قُدِّسَ سِرُّهُ الرَّبَّانِى තුමාණන් පැමිණ මා හට පහරක් ගසා අපගේ මුරීද් (අනුගාමිකයෙක්) වෙලත් තව්බා කිරීමකින් තොරව මැරුණා - නැගිට තව්බා කරන්නැයි අණ කරත්ම මා හට ප්‍රාණ ලැබුණි. ඒ නිසා මම තව්බා කරමි. පවසමින් ඔහු සියලු පාපයන්ට තව්බා කර කලීමා ව උසුරමින් සිටින විටම හිස පැත්තකට ඇල වුණි. ඒ සමඟ ඔහු මරණයට පත්විය.

සර්කාර් බග්දාද් හස්රත් ගවුසුල් ආලම් رحمة الله تعالى عليه තුමාණන්ගේ මුරීද් ස්නේහවන්තයන්ට සුභ පැතුම්! බග්දාදයේ නායක رضى الله تعالى عنه තුමාණන් පවසන්නේ මාගේ මුරීද් (අනුගාමිකයන්) කොපමණ පාපයන් කර තිබුණත් තව්බා කරන තෙක් මරුමුවට පත් නොවන බවයි. (අක්බාරුල් අහුයාර් පි.19)

صَلُّوا عَلَى الْحَبِيْب! صَلَّى اللّٰهُ تَعَالٰى عَلٰى مُحَمَّد

# සිත අත්ල තුලයි තිබෙන්නේ

හZස්රත් සෙයිදුනා උමර් බස්Zසාස් رحمۃ اللہ تعالیٰ علیہ තුමාණන් මෙසේ පවසා සිටින්නේය. වරක් ජුම්ආ දිනයේ මා ගව්සුල් ආලම් علیہ رحمۃ اللہ الاکرم තුමාණන් සමග ජාමිආ මස්ජිදයට යමින් සිටියෙමි. එසේ යන අතරේ වෙනදා නම් මුර්ෂිද් සමඟ ජුම්ආ සඳහා මස්ජිදයට යන අවස්ථාවේ මුසාපහා කිරීමට සෙනග රැස්වෙමින් සිටින අතර අප කොතරම් අමාරුවෙන්ද පිටත් වන්නේ? නමුත් අද කවුරුත් දකින්නවත් නැත්තේ ඇයි කියා මාගේ සිත් තුල ප්‍රශ්ණයක් ඇති විය. එවිටම හස්රත් ගව්සුල් ආලම් علیہ رحمۃ اللہ الاکرم තුමාණන් මා දෙස බලා මඳ සිනහව පෑහ. එවලේම මිනිසුන් මුසාපහා කිරීමට රැස් කරමින් පැමිණියහ. කොතරම් දැයි පවසනවානම් මා හා එතුමාණන් මහා සෙනගක් අතර මැදි වී සිටියහ. එවෙලේ මීට වඩා කලින් තිබු තත්වය හොඳයි කියා සිතුවිල්ලක් ඇති විය. එවිට එතුමාණන් මා හට මෙසේ පැවසූහ. උමර් ඔබට නේද සෙනඟ අවශ්‍ය වුණේ? ඔබ දන්නේ නැද්ද ජනයාගේ සිත් මාගේ අත්ල මත බව සිතුවොත් මා වෙත යොමු කරමි. නැත්නම් දුරස් කරමි.(සුZබ්දතුල් ආසාර් පි.94)

صَلُّوا عَلَى الْحَبِيب! صَلَّى اللّٰهُ تَعَالٰى عَلٰى مُحَمَّد

# අල්මදද් යා ගවුසුල් අඃලම්

හස්රත් බෂ්ර් කර්Zසී رحمۃ اللہ تعالیٰ علیہ තුමාණන් මෙසේ පවසා සිටින්නේය. මා හකුරු, (සීනි) පැටවු ඔටුවන් 14ක වෙළඳ කණ්ඩායමක් සමඟ ගමන් කරමින් සිටියෙමි. රාත්‍රියේ දී එක්

භයංකාර කැලෑවක කූඩාරම් ගසා නැවතුණෙමු. රාත්‍රියේදී මාගේ බඩුත් සමඟ ඔටුවන් 4 දෙනෙකු අතුරුදහන් විය. කොතරම් සෙවුවත් පළක් නොවිණි. කණ්ඩායමද පිටත් වී ගියහ. ඔටුවන් බලන්නා ද මා සමඟ නැවතුණේය. එක් වරම මාගේ සිතුවිල්ලේ මාගේ මුර්ෂිද් බග්දාදයේ නායක හස්රත් ගවුසුල් ආලම් رحمۃ اللہ تعالٰی علیہ තුමාණන් ඔබට කරදයක් සිදු වූ විට මට අඬ ගසන්න. ඉන්ෂා අල්ලාහ් عَزَّوَجَلَّ ඔබට සහනයක් ලැබෙනු ඇත යනුවෙන් පැවසූ වදන මතක් විය. එම නිසා මාද එසේ අඬ ගැසුවෙමි. යා ෂේක් අබ්දුල් කාදිර් මාගේ ඔටුවන් නැති විය යනුවෙන් පවසත්ම නැගෙනහිර දෙසින් සුදු ඇඳුමකින් සැරසුණු එක් උත්තමයෙකු දක්නට ලැබුණි. එතුමාණන් සංඥාවෙන් මා හට අඬ ගැසූහ. මාද ඔටුවන් බලා ගන්නා සමඟ එම ස්ථානයට ගියෙමි. එවිට එතුමාණන් අතුරුදහන් විය. මා විශ්මයට පත්ව වට පිට බැලූ විට මාගේ නැති වූ ඔටුවන් 4 දෙනා එම ස්ථානයේ දක්නට ලැබුණි. ඔවුන් වත් අල්ලාගෙන ඉක්මණින් ම කණ්ඩායම සමඟ එකතු වුණෙමි.

## ගව්සියා සාලාතය ඉටුකරන ක්‍රම

හස්රත් සෙයිදුනා ෂෙයික් අබුල් හසන් අලි අබ්බාස් رحمۃ اللہ تعالٰی علیہ තුමාණන්ට නැති වූ ඔටුවන් පිළිබඳ සිද්ධිය පැවසූ විට එතුමාණන් සෙයිදුනා ෂෙයික් අබ්දුල් කාදිර් ජීලානි තුමාණන්ගෙන් අසා ඇති බවට හස්රත් ෂෙයික් අබුල් කාසිම් رحمۃ اللہ تعالٰی علیہ මෙසේ පැවසූහ. යම් කෙනෙක් කරදරයකදී මට අඬ ගසයිද ඔහුගේ කරදර තුනී වන්නේය. යම් කෙනෙක් වේදනාවකදී මාගේ නාමය අඬ ගසයිද

ඔහුගේ වේදනාව නැතිවන්නේය. යම් කෙනක් මාගේ පිහිටෙන් අල්ලාහ් عَزَّوَجَلَّ ගෙන් තම අවශ්‍ය තාවය ඉල්ලා සිටි විට එය ඉටුවන්නේය. යම් කෙනෙක් නෆ්ල් රකාආත් දෙකක් ඉටු කර සෑම රකා අතයකම සූරතුල් ෆාතිහා එක්වරක් හා “කුල්හුවල්ලාහ්” එකොලොස් වරක් පාරායණා කර සලාමයට පසු සර්කාරේ මදීනා صَلَّى اللّٰهُ تَعَالٰى عَلَيْهِ وَاٰلِهٖ وَسَلَّم තුමාණන්ගේ නාමයෙන් සලවාතය උසුරා බග්දාද් පිහිටි දිශාවට අඩි 11ක් තබා ගොස් මාගේ නාමයෙන් අඬගසන්න. තවද තම අවශ්‍යතාවය පවසන්න. ඉන්ෂා අල්ලාහ් عَزَّوَجَلَّ ඔබේ අවශ්‍යතාවය ඉටුවිය හැක. (බහ්ජතුල් අස්රාර් වම:දනුල් අන්වාර්.194-197)

## අල්ලාහ් عَزَّوَجَلَّ හැර වෙන කෙනෙකුගෙන් උදව් පැතීම

හිතාදර ඉස්ලාමීය සහෝදරවරුණී සමහර විට කෙනෙකු සිතන්න පුළුවන් අල්ලාහ් عَزَّوَجَلَّ ගෙන් හැර වෙන කිසිවෙකුගෙන් උදව් නොපැතිය යුතුයි කියා, එනම් සියලු දේ කළ හැකි කාදිර්, නාසිර් වන්නේ ඔහු නිසා වෙන කෙනෙකුගේ උපකාර කුමකට ද? පිළිතුරු නම් මෙය ෂෛයිතාන්ගේ භයංකාර ප්‍රහාරයයි. ඔහු මෙසේ කොතරම් ජනයා මුළා කර ඇත්ද? අල්ලාහ් عَزَّوَجَلَّ වෙන කෙනෙකුගෙන් උදව් පැතීම තහනම් නොකර සිටින අවස්ථාවේ එසේ උදව් පැතීම තහනම් කිරීම කාටවත් කළ හැකි ක්‍රියාවක්ද? බලන්න කුර්ආනයේ අනුන්ගෙන් උපකාර ලබා ගැනීමට අවසර දී ඇත. සියලු දේ කිරීමට ශක්තිය ඇතත් අල්ලාහ් عَزَّوَجَلَّ තමන්

වෙනුවෙන් යටත් වැසියාගෙන් උපකාර ඉල්ලන්නේය. එනම් (ජුසුඋ 26-සූරාමුහම්මද්7)

إِنْ تَنْصُرُوا اللّٰهَ يَنْصُرْكُمْ

**තේරුම කන්සුල් ඊමාන්** :- අල්ලාහ් عَزَّوَجَلَّ ගේ දීන් (ආගමට) උදව් කළොත් අල්ලාහ් عَزَّوَجَلَّ ඔබට උදව් කරයි.

## හස්රත් ඊසා අනුන්ගෙන් උදව් පැතීම

හස්රත් සෛයිදුනා ඊසා රූහුල්ලා عَلٰى نَبِيِّنَا وَعَلَيْهِ الصَّلٰوةُ وَالسَّلَام තුමාණන් තම හවාරියුන් (ශිෂ්‍යයන්/ගෝලයන්) ගෙන් උදව් පැතීම අල්ලාහ් عَزَّوَجَلَّ මෙසේ පවසන්නේය. (ජු.28 සුරතුල් සfජ්14)

قَالَ عِيسَى ابْنُ مَرْيَمَ لِلْحَوَارِيِّينَ مَنْ أَنْصَارِي إِلَى اللّٰهِ ۖ قَالَ الْحَوَارِيُّونَ نَحْنُ أَنْصَارُ اللّٰهِ

**තේරුම කන්සුල් ඊමාන්** :- ඊසා ඉබනු මර්යම් හවාරියියීන් (ගෝලයන්)ට පැවසුවා අල්ලාහ් عَزَّوَجَلَّ වෙනුවෙන් මා හට උදව් (උපකාර) කරන්නේ කවුරුන්ද? හවාරියියීන්වරුන් අපි අල්ලාහ් عَزَّوَجَلَّ ගේ දීන් (ආගමට) උදව් කරුවන් යැයි පැවසූහ.

## හස්රත් මූසා මිනිසාගේ පිහිට පැතීම

හස්රත් මූසා කලීමුල්ලාහ් عَلٰى نَبِيِّنَا وَعَلَيْهِ الصَّلٰوةُ وَالسَّلَام තුමාණන්ට fපිර්අවුන් වෙත දේශනා කිරීමට යන ලෙස අණ ලැබූ අවස්ථාවේ එතුමාණන් ජනයාගේ පිහිට ලබා

ගැනීමට අල්ලාහ් عَزَّوَجَلَّ ගෙන් මෙසේ ඉල්ලා සිටියේය.

وَاجْعَلْ لِّيْ وَزِيْرًا مِّنْ اَهْلِيْ ۝ هٰرُوْنَ اَخِي ۝ اشْدُدْ بِهٖٓ اَزْرِيْ ۝

**තේරුම කන්සුල් ඊමාන් :-** තවද මා හට මාගේ පවුලේ කෙනෙක් ඇමැති කරනු මැන. ඔහු තමයි මාගේ සහෝදර හාරූන් ඔහු ගෙන් මගේ ධෛර්යයක් වඩවනු මැන. (ජු 16-සුරතුල්කාහා 29-31)

## ගුණ යහපත් පුරවැසියන් ද උපකාර කරන්නන්ය

තවත් තැනක මෙසේ පවසා ඇත.

فَاِنَّ اللّٰهَ هُوَ مَوْلٰىهُ وَجِبْرِيْلُ وَصَالِحُ الْمُؤْمِنِيْنَ ۚ وَالْمَلٰٓئِكَةُ بَعْدَ ذٰلِكَ ظَهِيْرٌ ۝

**තේරුම කන්සුල් ඊමාන් :-** සත්‍ය වශයෙන් අල්ලාහ් ඔවුන්ට පිහිට වන්නාය. තවද ජිබ්රීල් තවද විශ්වාසවන්ත උත්තමයන්ද ඉන්පසු මළාඉකාවරුද පිහිට වෙති. (ජු-28 සුරතුල් තහ්රීම්4)

## අන්සාර් වල තේරුම පිහිටවන්නාය

හිතාදර ඉස්ලාමීය සහෝදරවරුණි බලන්න ඔබ, අල්කුර්ආනය ඉතාමත් පැහැදිලිවම පවසා සිටින්නේ අල්ලාහ් عَزَّوَجَلَّ ද පිහිටවන්නේය ඔහුගේ අණ පරිදි ජිබ්රීල් عليه الصلوة والسلام හා පිළිගත් වැසියන් (නබිවරුන්, හා අවලියාවරුන්) හා මළාඉකාවරුද පිහිට වන්නන් බවයි. ඉන්ෂා අල්ලාහ් عَزَّوَجَلَّ දැන් අල්ලාහ් عَزَّوَجَلَّ හැර වෙන

කෙනෙකුට පිහිට විය නොහැක යන සැකයෙන් දුරු විය හැක. පුදුමයට කරුණක් නම් මුස්ලිම්වරුන් මක්කා මුකර්රමා වල සිට මදීනා මුනව් වරා වලට හිජ්රත් කර ගෙන පැමිණි අවස්ථාවේ පැමිණි පිරිසට මුහාජිර් හා ඔවුන්ට පිහිට වූ මදීනා වැසියන්ට අන්සාර් යැයි පවසනු ලැබේ. මෙය නුවණැත්තන් දනිති. එහි “අන්සාර්” යන වචනයේ තේරුම පිහිට වන්නාය.

යා අල්ලාහ් عَزَّوَجَلَّ මගේ වචනය සිතට කාවදිත්වා!

## අහ්ලුල්ලාහ් ජීවත් වෙති (අල්ලාහ්ගේ සමීපතයන්)

දැන් සමහර විට ෂෛතාන් ඔබට මෙසේ සැකයක් ඇති කළ හැක එනම් ජීවත්ව සිටින්නන්ගෙන් උපකාර (උදව්) පැතිය හැකි අතර මරණයට පසු උදව් ඉල්ලීම නොකළ යුතු බවයි. පහත සඳහන් ආයතය හා මාතෘකාව කියවීමෙන් පසු එයටත් පිළිතුරක් ලැබෙනු ඇත. ඉන්ෂා අල්ලාහ් عَزَّوَجَلَّ එනම්, (ජු 2 බකරා 154)

وَلَا تَقُوْلُوْا لِمَنْ يُّقْتَلُ فِيْ سَبِيْلِ اللّٰهِ اَمْوَاتٌ ؕ بَلْ اَحْيَآءٌ وَّلٰكِنْ لَّا تَشْعُرُوْنَ ﴿۱۵۴﴾

**තේරුම කන්සුල් ඊමාන්:-** තවද අල්ලාහ් عَزَّوَجَلَّ ගේ මාර්ග යෙන් ෂහීද් (ප්‍රාණය දුන්නන්)ට මැරුණු බවක් නොකියන්න ඔවුන් ජීවතුන් අතර සිටිති. ඔබ නොදන්නේය.

# නබිවරුන් ජීවත්වෙති

ෂුහදා වරුන් ජීවතුන් අතර සිටින්නේනම් ඔවුන්ටත් වඩා උසස් තත්වයක සිටින නබිවරුන් ජීවතුන් අතර සිටීම ගැන සැකය ඇති විය හැකිද? හසර්ත් සෙයිදුනා ඉමාම් බයිහකී عليه رحمة الله القوى නබිවරුන් ජීවතුන් අතර සිටීම ගැන පවසන විට දලාඉලුල් නුබුව්වා වල මෙසේ ලියා ඇත. නබිවරුනුත් ෂුහදා වරුන් සිටින ආකාරයෙන් අල්ලාහ් عَزَّوَجَلَّ වෙත ජීවත් වෙති. (අල්හාවී ලිල්පතාවා ලිස්සුයුති 2. පි කොටස263) ද

# අව්ලියාවරුන් ජීවතුන් අතර සිටිති

කෙසේ නමුත් නබිවරුන් අව්ලියාවරුන් ජීවතුන් අතර සිටිති අප මැරුණු පුද්ගලයන්ගේ නොව ජීවතුන් අතර සිටින්නන්ගෙන් ඉල්ලා සිටිමු තවද අල්ලාහ් عَزَّوَجَلَّ ලබා දුන් නිසා ඔවුන්ව අවශ්‍යතාවයන් සපුරන්නන් පිහිටවන්නන් යැයි අදහමු. එසේ ම අල්ලාහ් عَزَّوَجَلَّ ගේ අනු දැනුමකින් තොරව නබිවරුන් හා අව්ලියාවරුන්ට උදව් කිරීමට හෝ පිහිටවීමටවත් නොහැක.

# ඉමාමේ අ:ලම් عليه رحمة الله الاكرم තුමාණන් සර්කාර් صلى الله تعالى عليه واله وسلم තුමාණන්ගෙන් පිහිට පැතීය

හසරත් සෙයිදුනා ඉමාමුල් අ:ලම් අබූ හනීfපා عليه رحمة الله الاكرم තුමාණන් රසූල් صلى الله تعالى عليه واله وسلم තුමාණන්ගෙන් පිහිට පතමින් “කසීදා නු:මාන්” වල මෙසේ පවසති.

يَـا اَكْـرَمَ الثَّـقَـلَيْـنِ يَـا كَنْزَ الْوَرٰى          جُـدْلِىْ بِجُوْدِكَ وَاَرْضِنِىْ بِرِضَاكَ

اَنَـاطَـامِـعٌ بِـالْـجُـوْدِ مِنْكَ لَمْ يَكُنْ          لِاَبِىْ حَـنِـيْـفَةَ فِـى الْاَنَـامِ سِوَاكَ

එනම් ජින් හා මිනිසුන්ටත් වඩා අල්ලාහ් عَزَّوَجَلَّ ගේ ශ්‍රේෂ්ඨයාණෙනි! තවද තආලාගේ නි:මතයක් වූ ඔබට අල්ලාහ් තආලා ලබා දී ඇති දෙයින් මා හටද ලබා දෙනු මැන. එසේම අල්ලාහ් තආලා ඔබව තෘප්තිමත් කර ඇත. එසේම ඔබත් صلی اللہ تعالٰی علیہ والہ وسلم මාවත් තෘප්තිමත් කරනු මැන. මා ඔබේ සංග්‍රහශීලීභාව නිසා බලා සිටිමි. ඔබ صلی اللہ تعالٰی علیہ والہ وسلم හැර මෙම අබු හනීfපාට මහ්ලූක් (මැවීම්) වලින් කිසිවෙක් නොමැත.

صَلُّوْا عَلَى الْحَبِيْب!          صَلَّى اللّٰهُ تَعَالٰى عَلٰى مُحَمَّد

## බූසරී ඉමාම් ද උදව් (පිහිට) පැතීම

හස්රත් සෛයිදුනා ඉමාම් ෂරුපුද්දීන් බූසරී رحمۃ اللہ تعالٰی علیہ තුමාණන් සර්කාරේ මදීනා صلی اللہ تعالٰی علیہ والہ وسلم තුමාණන්ගෙන් තම සුප්‍රසිද්ධ “කසීදා බුර්දා” වේ උදව් (පිහිට) පතමින් මෙසේ පවසා ඇත.

يَـا اَكْـرَمَ الْـخَـلْقِ مَا لِىْ مَنْ اَلُوْذُبِهٖ          سِوَاكَ عِنْدَ حُلُوْلِ الْحَادِثِ الْعَمِمِ

සියලු මැවීම් වලටත් වඩා ශ්‍රේෂ්ඨයාණෙනි, මට කරදර (වේදනා) පැමිණි විට ආරක්ෂා ලැබීමට මට ඔබ හැර වෙන කිසිවෙක් නොමැත.

(කසීදා බුර්දා පි. 36 zසියාඋල්කුර්ආන්)

ඉම්දාදුල්ලාහ් මුහාජිර් මක්කී علیہ رحمۃ اللہ القوی “නාලඒ ඉම්දාද්” වල මෙසේ පවසන්නේය.

"පාප කර්මයන් පිරුණු කොට්ටයක දිවා රෑ නිදයමින් සිටිමි. මාව දැන් අමතක වූ සිහිනෙන් පුබුදන්න යා රසුලල්ලාහ්"

## ෂාහ් වලියුල්ලාහ් ගේ ඉඃතිකාද් (විශ්වාසය)

හzස්රත් ෂාහ් වලියුල්ලාහ් මුහද්දිස් දෙහ්ලවී عليہ رحمۃ اللہ القوی "හම්අත්" 11 දී ගවුසුල් අඃලම් رحمۃ اللہ تعالیٰ علیہ තුමාණන්ගේ ශ්‍රේෂ්ඨත්වය පවසන විට මෙසේ ලියා ඇත.

حضرتِ مُحْیُ الدین عبدُالقادِر جیلانی رَحمۃ اللہ تعالیٰ علیہ اند

ولہذا گفتہ اند کہ ایشاں در قبرِ خود مثل اَحْیاء تَصَرُّف می کُنَنْد۔

**තේරුම** :- එතුමා ෂෛයික් මුහියද්දීන් අබ්දුල් කාදිර් ජීලානී قُدِّسَ سِرُّہُ الرَّبَّانِی වන්නේය. එසේ කියන්නේ එතුමාණන් رحمۃ اللہ تعالیٰ علیہ තම කබ්රයේදීත් ජීවතුන් අතර සිටින්නන් කරන ආකාරයෙන් තසර්රුfප් කරන්නේය. (එනම් ජීවත්ව සිටින්නන්ට කළ හැකි සියල්ල කිරීම ශක්තියක් ඇතිව සිටින්නේය.)

صَلُّوْا عَلَى الْحَبِيْب! صَلَّى اللّٰهُ تَعَالٰى عَلٰى مُحَمَّد

## ලෝටා පෝච්චිය (කේතලයට සමාන භාජනයක්)

වරක් ජීලාන් දේශයේ මෂාඉඛ්වරුන්ගේ رَحِمَهُمُ اللّٰه تعالٰی කණ්ඩායමක් හස්රත් සෛයිදුනා ගව්සුල් ආලම් علیہ رحمۃ اللہ الاکرم තුමාණන් බැහැදැකීමට පැමිණි

අවස්ථාවේ එතුමාණන්ගේ ලෝටා (පෝච්චිය) කිබ්ලාවට විරුද්ධ පැත්තට හැරී ඇති බව දුටුවාය. (ඒ පිළිබඳ එතුමාණන් දැනුවත් කරන ලදී) එවිට තම හාදිම් (සේවක) දෙස ජලාල් (ගාම්භීර) බැල්මක් හෙලූහ. ඔහු එතුමාණන් رحمۃ اللہ تعالٰی علیہ ගේ ජලාල් දරාගත නොහැකිව එක්වරම ඇද වැටී දඟලමින් ප්‍රාණය හෙලූහ. ඉන්පසු ලෝටා (පෝච්චිය) දෙස බැල්මක් දැමු විට එයද කිබ්ලාව දෙසට හැරිණි.

## ලෝටා පෝච්චිය කිබ්ලාව දෙසට තබන්න

සර්කාරේ හස්රත් ගවුසුල් ආලම්ගේ අනුගාමිකයිනි! සත්‍ය වශයෙන්ම ආලයේ උසස්ම තත්වය නම් තම ස්නේහවන්තයාගේ සියලු ක්‍රියා සතුටු සිතින් තමනුත් ක්‍රියාවට නැංවීමයි. එම නිසා හැම වෙලේම පෝච්චියේ මූණත කිබ්ලා දෙසට තබන්න. හZස්රත් මුහද්දිසේ අ:ලම් පාකිස්ථාන් හස්රත් මෞලානා සර්දාර් අහ්මද් සාහිබ් رحمۃ اللہ تعالٰی علیہ තුමාණන් ලෝටා පමණක් නොව තම පාවහන් යුගලද කිබ්ලාව දෙසට තබන්නේය. අල්හම්දුලිල්ලාහ් මදීනාවේ ස්නේහවන්ත عُفِیَ عَنۡہُ එම අව්ලියාවරුන් අනුගමනය කරමින් හැකි තරමින් තම ලෝටා පෝච්චිය හා පාවහන් කිබ්ලාව දෙසට හරවා තබන්නෙමි. එසේම සියලු දේ කිබ්ලා දෙසට තැබීමට ද උත්සාහ කරමි.

## කිබ්ලාව දෙසට හැරී වාඩිවන්නාගේ සිද්ධිය

හිතාදර ඉස්ලාමීය සහෝදරවරුණි! අනෙකුත් දේවල් සමඟම අපගේ මුහුණද කිබ්ලාව දෙසට තැබීමට

සිතා ගත යුතුය. එහි බරකතයන් කිව නොහැකි තරම්ය. එම නිසා :- හසරත් සෙයිදුනා ඉමාම් බුර්හානුද්දීන් ඉබ්රාහීම් Zසර්නෝජී رحمة الله تعالى عليه තුමාණන් පවසා සිටින්නේ ශිෂ්‍යයන් දෙදෙනෙකු ආගමික දැනුම ලබා ගැනීම සඳහා පිට රටකට ගියහ. වසර දෙකක්ම දෙදෙනා එකට පාඩම් කළහ. ඉන් පසු තම මව්රටට පැමිණි විට ඔවුන්ගෙන් කෙනෙක් fපකීහ් (එනම් ඉතා විශිෂ්ඨ මුfප්ති ආලිම්) වරයෙකු විය. දෙවැන්නා දැනුමෙන් හැකියාවෙන් තොර විය. එම නගරයේ උලමාවරුන් (ආලිම්වරුන්) ඒ පිළිබඳව විමසිලිමත් වීමේදී වෙනස තේරුම් ගත හැකි විය. එනම් දෙදෙනාම කළ කී දේවල්, පාඩම්, දැනුම ලබා ගැනීමේ ක්‍රමය යනාදිය එකම ආකාරයෙන් සිදුවූවත් කෙනෙක් එයින් මූfප්ති කෙනෙක් වීමට මග පෑදීමත් කෙනෙක් කිසිම ප්‍රයෝජනයකට නැතිවීමත් අතර වෙනසට කාරණය නම් ඉතාමත් පැහැදිලිව දක්නට ලැබුණි. එනම් මුfප්ති කෙනෙක් බවට පත්වූ ඔහු පාඩම් කරන අවස්ථාවේ සෑම විටම කිබ්ලාව දෙසට හැරී වාඩි වීමයි. එය පුරුද්දක් ලෙසම කරයි. එසේ ම අනෙක් සිසුවා හිතුමතේට වාඩි වී පාඩම් කරයි. එසේම කිබ්ලාවට විරුද්ධ පැත්තෙට හැරී වාඩි වීම ඔහුගේ පුරුද්දයි. එම නිසාම සියලුම උලමාවරුන් (ආලිම්වරුන්) ඒකමතිකව තීරණයකට පැමිණියහ. එනම් එම සිසුවා කිබ්ලා දෙසට හැරී පාඩම් කරමින් කිබ්ලාවට ගරු කිරීම නිසා මෙම භාග්‍ය ලබා මුfප්ති කෙනෙක් විය. මක් නිසාද යත් වාඩිවීමේදී කඃබතුල්ලාහ් ෂරීපය දෙසට මුහුණලා සිටීම සුන්නත් වන්නේය.

(තඃලීමුල් මුතඅල්ලිම් තරීකුල් ඉල්ම් පි 68)

# "කඃබතුල්ලාහිල් කරීම්" යන වාක්‍යයේ ඇති අක්ෂර 14 ට කිබ්ලාව දෙසට හැරී සිටීමට සරිලන සේ මදනි පුෂ්පයන් 14 ක්

1) සර්කාරේ මදීනා, සුල්තානේ බා කරීනා, අප උතුම් නබි නායක صلی اللہ تعالیٰ علیہ واٰلہٖ وسلم තුමාණන් සාමාන්‍යයෙන් කිබ්ලා දෙසට හැරී වාඩි වෙති. (ඉහ්යාඋල් උලූම් කොටස පි 449)

2) හස්රත් සෙයිදුනා අබ්දුල්ලා ඉබනු උමර් رضی اللہ تعالیٰ عنہما මෙසේ රිවායත් කරන්නේය. හූසූරේ අක්රම්, නූරේ මුජස්සම්, ෂාහේ බනී ආදම්, රහ්මතුල් ලිල් ආලමීන් صلی اللہ تعالیٰ علیہ واٰلہٖ وسلم තුමාණන්ගේ රුවන් වැකියක් නම් මජ්ලිස් වලින් ඉතාමත් ගෞරවනීය මජ්ලිසය නම් කිබ්ලාව දෙසට මුහුණලා තිබෙන අල් මුෂජීමුල් අව්සක්ලින් තබරානි මජ්ලිසයයි. (කොටස 6 පි.161 හදීස් 8361)

3) අල්ලාහ් عَزَّوَجَلَّ ගේ මහ්බූබ් රහ්මතුල්ලිල් ආලමීන් අති උත්තම නබි නායක صلی اللہ تعالیٰ علیہ واٰلہٖ وسلم තුමාණන් පැවසූ බවට හස්රත් සෙයිදුනා අබ්දුල්ලා ඉබ්නු අබ්බාස් رضی اللہ تعالیٰ عنہما තුමාණන් මෙසේ රිවායත් කරති. සෑම දෙයකටම ගෞරවයක් ඇත. වාඩි වී සිටීමේ ගෞරවය නම් කිබ්ලාව දෙසට හැරී සිටීමයි. (අල්මුඅජමුල් කබීර් ලිත් තබරානි කො 10 පි 320 හදීස් 10781)

4) හස්රත් සෙයිදුනා අබු හුරෛරා رضی اللہ تعالیٰ عنہ තුමාණන් විසින් රිවායතයක් නම් මදීනාවේ නායක උත්තම නබි නායක صلی اللہ تعالیٰ علیہ والہ وسلم තුමාණන් මෙසේ පවසා ඇත්තාහ. සෑම දෙයකම සර්දාරී (නායකත්වයක්) ඇත. මජ්ලිසයේ සර්දාරී (නායකත්වය) කිබ්ලාව දෙස මුහුණ ලා සිටීමයි. (තබරානී කොටස.2 පි.20 හදී 2354) අල්මුඅජමුල්

5) මුබල්ලිග්, මුදර්රිස් (දේශකයන්/ගුරුවරුන්) දේශනා කරන අවස්ථාවේ හෝ උගන්වන අවස්ථාවේ තම පිටු පස කිබ්ලාව දෙසටත් මුහුණත විරුද්ධ පැත්තට කිරීම සුන්නත්ය. එසේ කිරීමෙන් අසන්නන්ට ආගමික දැනුමත් කිබ්ලාව දෙසට මුහුණලා සිටීමට හැකිය. එම නිසාම හස්රත් සෙයිදුනා අල්ලාමා හාfපිල් සහාවී علیہ رحمۃ اللہ القوی තුමාණන් මෙසේ පැවසූහ. නබියේ කරීම් صلی اللہ تعالیٰ علیہ والہ وسلم තුමාණන් කිබ්ලා දෙසට පිටුපා සිටින්නේ එතුමාණන් ගෙන් ඉගෙන ගන්නන්, දේශනා අසන්නන්ට කිබ්ලාව දෙසට මුහුණලා සිටීමට හැකි වීම සඳහාය. (අල්මකාසිදුල් හසනා පි.88)

6) හස්රත් සෙයිදුනා අබ්දුල්ලා ඉබ්නු උමර් رضی اللہ تعالیٰ عنہما වැඩි වශයෙන් කිබ්ලාව දෙසට මුහුණලා සිටිති.

7) හස්රත් සෙයිදුනා මුගීස් رحمۃ اللہ تعالیٰ علیہ පැමිණි අවස්ථාවේ හස්රත් සෙයිදුනා මක්හූල් رحمۃ اللہ تعالیٰ علیہ

තම අසලින්ම ඉඳ ගැනීමට තැනක් හිස් කර දුන්හ. නමුත් හස්රත් මුගීස් එම ස්ථානයේ වාඩි වීම ප්‍රතික්ෂේප කර කිබ්ලාව දෙසට මුහුණලා ඉඳගත් අතර කිබ්ලාවට මුහුණලා ඉඳ ගැනීම ඉතාම ශ්‍රේෂ්ඨයි පැවසූහ. (fපයිසුල් කදීර් බිතගයියුර් යසීර් කො:2 පි649)

8) කුර්ආන්, දර්සේ නිzසාමි (කිතාබ්) උගන්වන මුදර්රිසීන් (ගුරුවරුන්) සුන්නතයේ නියියතය සමග කිබ්ලාව දෙසට පිටුපා ශිෂ්‍යයන් දෙස මුහුණලා සිටින්න. එසේ කළ විට සිසුන්ගේ මුහුණ කිබ්ලා දෙසට හැරී තිබෙනු ඇත. ඒ සමඟ කිබ්ලා දෙසට මුහුණලා සිටීමේ වැදගත්කම, සුන්නතය, හික්මතය, නියියතය යනාදියෙන් සිසුන්ව දැනුවත් කරන්න. තවත් කුසල් ලබාගැනීමට කටයුතු කරන්න. ඉගැන් වීමෙන් පසු කිබ්ලාව දෙස හැරී වාඩිවීමට උත්සාහ කරන්න.

9) ආගමික දැනුම ලබන සිසුන් ගුරුවරයා දෙසට අවධානය යොමු කළ හැකි ආකාරයට කිබ්ලාව දෙසට හැරී ඉඳගන්න. නැතහොත් දැනුම ලබා ගැනීම වෙහෙස කර විය හැක.

10) කතීබ් කුත්බා දෙන අවස්ථාවේ කඃබාවට පිටුපා සිටීම සුනනත් ය. තවද අසන්නන් කතීබ් දෙසට මුහුණලා සිටීම මුස්තහබ් වන්නේය.

11) විශේෂයෙන් තිලාවත්, ආගමික කියවීම්, f'ජ්ත්වා, ලියන ලේඛකයන්, එක්රැස්කරන, උදුආ, හා සලාතු සලාම් යන අවස්ථාවන් වල සිටගෙන හෝ ඉඳ ගෙන සිටින විට කිබ්ලාව දෙසට මුහුණලා සිටීමට පුරුදු කරගන්න එසේ කර ආහිරතයට පින් එක් රැස් කර ගන්න.

12) හැකිනම් මේසය හා පුටුව කිබ්ලාව දෙසට හරවා තැබීමෙන් සෑම අවස්ථාවකම කිබ්ලාව දෙස මුහුණලා සිටිය හැකිය.

13) පින් රැස් කිරීමේ අරමුණක් නොමැතිව කිබ්ලාව දෙසට හැර ඉඳ ගත් විට පින් (සවාබ්) නොලැබේ. එම නිසා හොඳ හොඳ නියියතයන් කර ගත යුතුය. උදා :-

1. ආහිරතයේ සවාබ් (පින්)
2. සුන්නතය ඉටුකිරීම
3. කඃබාවට ගරු කිරීම සඳහා කිබ්ලාව දෙසට මුහුණලා සිටිමි.
4. ආගමික පොත් පත් කිය වීමේදී හා ආගමික දැනුම ලබා ගන්නා අවස්ථාවේ මෙවැනි නිය්යතයන් අධිෂ්ඨානය කර ගත හැක. කිබ්ලාව දෙසට හැරී සිටීමේ සුන්නත් ක්‍රමය අනුව ආගමික ඥානයේ බරකතය බලාපොරොත්තු වෙමි.

14) පාකිස්ථාන්, ඉන්දියාව, නේපාලය, බංගලාදේශය හා ශ්‍රී ලංකාව යනාදී රටවල කිබ්ලාව දෙසට හැරුණු විට මදීනා මුනව්වරා දෙසටද මුහුණලා සිටීමට සිදුවන නිසා මදීනා මුනව්වරාවට ගෞරවය කිරීම සඳහා මදීනා මුනව්වරාවට මුහුණලා සිටිමි කියා නියයත් කර ගන්න.

**සවාබුල් ජාරියා (සදකතුල්ජාරියා)**

**(දිගටම ලැබෙන කුසල්)**

**මෙම පොත් පිංච කියවීමෙන් පසු අනුන්ටත් දී උදව් වෙන්න. තවද මීලාද් උත්සව වලත්, අව්ලියාවරුන්ගේ දානයන් (කන්දූරි) වලත්, මංගලයය උත්සව වලදීත්, කතමුල් කුර්ආන් තමාම් කරන අවස්ථාවලත්, තවද ආගමික උත්සව වලදීදීත්, මළවුන්ට පින් ලබාදීම පිණිසත්, තවද අමාරු දුෂ්කර අවස්ථාවලින් මිදීමත් මෙම පොත මක්තබතුල් මදීනාවෙන් මිළදීගෙන අධික ලෙස පින් (කුසල්) ලබා ගන්න.**

මෙම පොත භාෂා ගණනාවකින් **www.dawateislami.net** වෙබ් අඩවියේ පළ කර ඇති අතර අවශ්‍ය භාෂාවකින් කියවීමට ඒ වෙත යොමුවන්න.

# Keep Watching Madani Channel

شاهدوا القناة المدنية    مدنی چینل دیکھتے رہیے

Dawat-e-Islami, an international non-political propagational movement of Qur'an and Sunnah. Please, attend Dawat-e-Islami's weekly Ijtima held in your city. In Karachi, the weekly Ijtima is held every Thursday after Salaatul-Maghrib at Faizan-e-Madina, Mahallah Saudagran, Old Sabzi Mandi, Baab-ul-Madina Karachi, Pakistan. It is also a Madani request to spend the whole night in the Ijtima.

## Details of Frequencies for Madani Channel

| S.no | Satellite | Beam Type | Position | Dowlink | Frequency | Transmission | Polarity | Symb Rate | FEC |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | Asiasat 3s | Global | 105.5 E | C- Band | 3739 | Digital | Vertical | 2815 | 3/4 |
| 2 | Intelsat 10 | Africa & Europe Beam | 68.5 E | KU Band & DTH | 12682 | Digital | Horizontal | 27757 | 1/2 |
| 3 | Atlantic Bird 4A | Middle East | 7.2W | KU Band | 10992 | Digital | Vertical | 27500 | 3/4 |
| 4 | Eurobird1 | Europe | 28.5 E | Sky Platform | 12523 | Digital | Horizonta | 27500 | 2/3 |

www.dawateislami.net

اَلْحَمْدُ لِلّٰهِ رَبِّ الْعٰلَمِيْنَ وَالصَّلٰوةُ وَالسَّلَامُ عَلٰى سَيِّدِ الْمُرْسَلِيْنَ اَمَّا بَعْدُ فَاَعُوْذُ بِاللّٰهِ مِنَ الشَّيْطٰنِ الرَّجِيْمِ بِسْمِ اللّٰهِ الرَّحْمٰنِ الرَّحِيْمِ

٧٨٦
قفل مدينه
٩٢

الصلوة و السلام عليك يارسول الله

# සුන්නතයන් හි වසන්තයන්

අල්හම්දුලිල්ලාහ් عَزَّوَجَلَّ අල්කුර්ආනය හා සුන්නතයන් උගන්වන අහ්ලුස් සුන්නත්වල් ජමාඅතයේ දේශපාලනයෙන් තොර ලෝක සංවිධානයක් වන දඃවතේ ඉස්ලාමියේ සුවඳවත් මදනි වට පිටාව තුල වැඩි වශයෙන් සුන්නතයන් ඉගෙනීමත් ඉගැන්වීමත් සිදු කරනු ලැබේ. සෑම බ්‍රහස්පතින්දා සවස මඃරිබ් සලාතයේ සිට නො. 10 මැසෙන්ජර් වීදියේ කොළඹ 12 යන ලිපිනයේ සිදු වන සුන්නත් වලින් පිරුණු ඉජ්තිමාවේ ආරම්භයේ සිට අවසානය දක්වා සහභාගි වි වැඩි වැඩියෙන් පින් (කුසල්) රැස්කර ගන්න.

තවද රසුල් صَلَّى اللّٰهُ تَعَالٰى عَلَيْهِ وَآلِهٖ وَسَلَّم තුමානන් ගේ ස්නේහවන්තයන් සමග සුන්නතයන් ඉගෙන ගැනීමට මදනි කාෆිලාවල ගමන් කරන්න. ඔබ ශීලාචාර මුස්ලිම්වරු (හොඳ පුරවැසියන්) වීමට මක්තබතුල් මදීනා එනම් දඃවතේ ඉස්ලාමි පොත් හලකින් මදනි ඉන් ආ මාත් කාඩ් පතක් සෑම ඉස්ලාමි මාස ආරම්භයේදීම ලබාගෙන එහි ඇති පරිදි ක්‍රියා කර (අමල් කර) දිනපතා ෆික්රේ මදීනා (තම ක්‍රියාවන් අධීක්ෂණ) කරමින් එය පුරවා සෑම ඉස්ලාමීය මාසයේ අවසානයේදී ඔබේ ප්‍රදේශයේ දඃවතේ ඉස්ලාමි බලධාරියාට එය භාර දෙන්න. ඉන්ෂා අල්ලාහ් عَزَّوَجَلَّ මෙහි බරකතයෙන් ෆර්ල් වාජිබ් හා සුන්නතයන් නිසියාකාරව පිළිපැදීමටත් පාප ක්‍රියාවන් වලින් ඈත් වී ඊමානය ආරක්ෂා කර ස්ථිර තත්වයකට පැමිනීමක් දැකිය හැක.

සෑම ඉස්ලාමීය සහෝදරවරුන් තම තමාවත් සියලු ලෝවැසියන් යහමගට ගැනීමට උත්සාහ දරමි (කරමි) ඉන්ෂා අල්ලාහ් عَزَّوَجَلَّ යන මදනි (යහ) අරමුණ (මතය) තම අරමුණ කර ගත යුතුයි. තමන් ශිලාචාර (යහමගට පැමිනීම) වීමට මදනි ඉන්ආමාත් අනුව ක්‍රියා (අමල්) කරන අතර ලෝ වැසියන් (ලෝකයේ ජනතාව) ශිලාචාර කිරීමට මදනි කාෆිලාවේ ගමන් කිරීමෙන් ඉහත සඳහන් මදනී අරමුණ ඉටුකර ගත හැකිය.